#### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

##### අති විශෙෂ

**අංක 2383/20 - 2024 මැයි මස 07 වැනි අඟහරුවාදා - 2024.05.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 94/47 (VIII)

**(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත**

6(2)(ආ) වගන්තිය සහ 21(2)(ආ) වගන්තිය යටතේ වූ නියමය

(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6(2)(ආ) වගන්තිය සහ 21(2)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින්, මේ නියමය මගින්,

(අ) ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති "බත්තරමුල්ල බටපොත ශ්‍රී සුදර්ශනාරාම පුරාණ විහාරය" යනුවෙන් හඳුන්වනු ලබන භූමි ප්‍රදේශය, නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පත් කරනු ලැබේ;

(ආ) නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කරනු ලැබූ "බත්තරමුල්ල බටපොත ශ්‍රී සුදර්ශනාරාම පුරාණ විහාරය" සම්බන්ධයෙන් පරිබාහිර සැලැස්මක් සකස් කළ යුතු බවට විධානය කරනු ලැබේ; සහ

(ඇ) 2015 අගෝස්තු 24 දිනැති අංක 1929/9 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉහත කී ආඥාපනතේ 6(2)(ආ) සහ 21 (2)(ආ) වගන්ති යටතේ සාදන ලද නියමය මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ;

**ප්‍රසන්න රණතුංග,**
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2024 මැයි මස 02 වන දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

**බත්තරමුල්ල බටපොත ශ්‍රී සුදර්ශනාරාම පුරාණ විහාර භූමිය සංයුක්ත වන ප්‍රදේශය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ, පල්ලෙපත්තුව සුළු කොට්ඨාසයේ, හේවාගම් කෝරලේ තලංගම (දකුණ) ග්‍රාමයේ පිහිටි, බටපොතේවත්ත සහ ගොරකගහවත්ත නැමති ඉඩමට සර්වේයර් ජනරාල්ගේ 2017 දෙසැම්බර් මස 08 දිනැති අංක CO/KDW/2017/252 දරන අනුරේඛනයේ කැබලි අංක "1" සහ අංක "2" දරන හෙක්ටයාර් 0.7805 ක් (අ.1; රූ.3; පර්.28.59) විශාලත්වයෙන් යුක්ත පහත දැක්වෙන පරිදි මායිම් වූ ප්‍රදේශයඃ-

**කැබලි අංක 1** : බටපොතේවත්ත සහ ගොරකගහවත්ත හෙක්ටයාර 0.7325 (අ.1; රූ.3; පර්.11.59)

*උතුරට* : ඊ.ඕ. සමරක්කොඩි සහ තවත් අය හිමිකම් කියන අඹගහවත්ත සහ මාර්ගය (ප්‍රාදේශීය සභා)

*නැගෙනහිරට* : මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ නිහාල් විජේසිංහ සහ තවත් අය හිමිකම් කියන ගොරොක්ගහවත්ත

*දකුණට* : නිහාල් විජේසිංහ සහ තවත් අය හිමිකම් කියන ගොරොක්ගහවත්ත සහ රොබට් ගුණවර්ධන මාවත

*බටහිරට* : රොබට් ගුණවර්ධන මාවත සහ ඊ.ඕ. සමරක්කොඩි සහ තවත් අය හිමිකම් කියන අඹගහවත්ත

**කැබලි අංක 2** : බටපොතේවත්ත සහ ගොරකගහවත්ත හෙක්ටයාර 0.0430 (අ.0; රූ.0; පර්.17.00)

*උතුරට* : පාර සහ රොබට් ගුණවර්ධන මාවත

*නැගෙනහිරට* : රොබට් ගුණවර්ධන මාවත

*දකුණට* : කොල්ලූරගේ චන්ද්‍රසිරි පෙරේරා සහ තවත් අය හිමිකම් කියන ගොරොක්ගහවත්ත

*බටහිරට* : කොල්ලූරගේ චන්ද්‍රසිරි පෙරේරා සහ තවත් අය හිමිකම් කියන ගොරොක්ගහවත්ත සහ පාර

EOG 05 - 0054/1

එල්.ඩී.බී. 94/47 (ix)

**(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත**

6(2)(ආ) වගන්තිය සහ 21(2)(ආ) වගන්තිය යටතේ වන නියමය

(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6(2)(ආ) වගන්තිය සහ 21(2)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින්, මේ නියමය මගින්-

(1) ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති "කඩිගමුව ශ්‍රී නාගවනාරාම රජමහා විහාර පූජා භූමි ප්‍රදේශය" නාගරික සංවර්ධන ප්‍රදේශයක් වියයුතු බවට ප්‍රකාශයට පත් කරනු ලැබේ; සහ

(2) "කඩිගමුව ශ්‍රී නාගවනාරාම රජමහා විහාර පූජා භූමි ප්‍රදේශය" සඳහා පරිබාහිර සැලැස්මක් සකස් කරනු ලැබිය යුතු බවට විධානය කරනු ලැබේ.

**ප්‍රසන්න රණතුංග,**
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2024 මැයි මස 02 වන දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

**කඩිගමුව ශ්‍රී නාගවනාරාම රජමහා විහාර පූජා භූමිය සංයුක්ත වන භූමි ප්‍රදේශය**

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ, අංක 21, කඩිගමුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කඩිගමුව ග්‍රාමයේ පිහිටි, සර්වේයර් ජනරාල්වරයාගේ කේජී/ආර්එම්බී/2023/164 අංක දරන 2023 ඔක්තෝබර් මස 16 වන දිනැති, අනුරේඛනයේ දක්වා ඇති "පන්සල්වත්ත" යනුවෙන් හඳුන්වනු ලබන කැබලි අංක "ඒ"මගින් සංයුක්ත, හෙක්ටයාර් 1.9264 ක විශාලත්වයෙන් යුක්ත පහත දැක්වෙන පරිදි මායිම් වූ ප්‍රදේශයඃ-

**කැබලි අංකය ඃ 'ඒ' - පන්සල්වත්ත**

*උතුරට* : ශ්‍රී නාගවනාරාම රජමහා විහාරය හිමිකම් කියන පන්සල්වත්ත, එන්.ජී.එන්. ජෝතිරත්න හිමිකම් කියන හිටිනාවත්ත සහ මාර්ගය

*නැගෙනහිරට* : මාර්ගය සහ මාර්ගය (ප්‍රාදේශීය සභා)

*දකුණට* : මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ එච්.එම්.එන්.එම්. මාගනන්ද හිමිකම් කියන හපුගහවත්තේඅරඹ

*බටහිරට* : එච්.එම්.එන්.එම්. මාගනන්ද හිමිකම් කියන හපුගහවත්තේඅරඹ, මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ ශ්‍රී නාගවනාරාම රජමහා විහාරය හිමිකම් කියන පන්සල් වත්ත

EOG 05 - 0054/2

එල්.ඩී.බී. 94/47 (ix)

## (269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත

6(2)(ආ) වගන්තිය සහ 21(2)(ආ) වගන්තිය යටතේ වන නියමය

(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6(2)(ආ) වගන්තිය සහ 21(2)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින්, මේ නියමය මගින්-

(1) ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති "වඳුරුප්ප ථේරපුත්තාභය රජමහා විහාර පූජා භූමි ප්‍රදේශය" නාගරික සංවර්ධන ප්‍රදේශයක් වියයුතු බවට ප්‍රකාශයට පත් කරනු ලැබේ; සහ

(2) "වඳුරුප්ප ථේරපුත්තාභය රජමහා විහාර පූජා භූමි ප්‍රදේශය" සඳහා පරිබාහිර සැලැස්මක් සකස් කරනු ලැබිය යුතු බවට විධානය කරනු ලැබේ.

**ප්‍රසන්න රණතුංග,**
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2024 මැයි මස 02 වන දින,
කොළඹ දී ය.

### උපලේඛනය

### වඳුරුප්ප ථේරපුත්තාභය රජමහා විහාර පූජා භූමිය සංයුක්ත වන භූමි ප්‍රදේශය

දකුණු පළාතේ, හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, අම්බලන්තොට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ, අංක 142, වඳුරුප්ප ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වඳුරුප්ප ග්‍රාමයේ පිහිටි, "සරප්පුගෙවත්ත, මහවැවඅද්දරලන්ද, කොරඩින්ගි අප්පුවැවුවත්ත" නමැති ඉඩමට සර්වේයර් ජනරාල්වරයාගේ 2023 නොවැම්බර් මස 30, අංක එච්.ඒ/ඩී.එස්.ඕ/2023/236 දරන අනුරේඛනයේ කැබලි අංක "1" ලෙස ලකුණු කර නිරූපනය කර ඇති හෙක්ටෙයාර් 2.4702 ක් විශාලත්වයෙන් යුක්ත පහත දැක්වෙන පරිදි මායිම් වූ ප්‍රදේශයඃ-

**කැබලි අංක ඃ 1 -**

*උතුරට* : අගපි 62 හි කැබලි අංක 3ඒජී (කොටසක්) සහ කැබලි අංක 3ඒ (කොටසක්)

*නැගෙනහිරට* : අගපි 62 හි කැබලි අංක 3ඒ (කොටසක්) සහ කැබලි අංක 7 (කොටසක්)

*දකුණට* : අගපි 62 හි කැබලි අංක 3ඒ (කොටසක්) සහ කැබලි අංක 7 (කොටසක්) සහ 1 (කොටසක්)

*බටහිරට* : අගපි 62 හි කැබලි අංක 7 (කොටසක්) සහ කැබලි අංක 1 (කොටසක්) සහ කැබලි අංක 3ඒජී (කොටසක්)

EOG 05 - 0054/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.